## අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර කරුණාකර පහත උපදෙස් සලකා බලන්න

1. මුලින්ම ඔබ මෙහි ඇති (Google Link) ගුගල් ලින්ක් එක ක්ලික් කරන්න. ඒ අනුව එහි ඔබගේ විස්තර ඇතුලත් කර අවසානයේ ඔබට ලැබෙන යොමු අංකය ඔබගේ අයදුම්පතේ ඇති කොටුව තුළ ලියන්න. ඔබගේ දත්ත එක් වරක් පමණක් ඇතුලත් කරන්න. https://forms.gle/CSK2iNMoMjzuXh6WA (Google link එක පිරවීම අත්‍යාවශ්‍ය බව කරුණාවෙන් සලකන්න.)

2. ඔබ තනතුරක් සඳහා අයදුම් කරන විට ඉහත දක්වා ඇති ආදර්ශ යෙදුම පමණක් භාවිතා කරන්න. මෙහි ඇති අයදුම්පත්‍රයේ එම යොමු අංකය සහිත කොටුවේ එම අංකය සඳහන් කරන්න.

3. කරුණාකර ඔබ අයදුම් කරන තනතුර සහ ඔබ අභ්‍යන්තර හෝ බාහිර අයදුම්කරුද යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ ඉහළින් ලියන්න. (දැනට මණ්ඩලයේ ස්ථිර සේවක සංඛ්‍යාවක සේවය කරන අයදුම්කරුවන් අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස සලකයි. මණ්ඩලයට සම්බන්ධ වීමට කැමති අයදුම්කරුවන් බාහිර අයදුම්කරුවන් ලෙස සලකයි)

4. ඔබ තනතුරු එකකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් පුරවා එක් එක් අයදුම්පත්‍රයේ සහතික පිටපත් අමුණන්න. ඉන්පසු එක් එක් අයදුම්පත් වෙන වෙනම තැපැල වෙත යොමු කරන්න.

5. රජයේ/සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන/දෙපාර්තමේන්තු ප්‍රධානීන් හරහා අයදුම්පත් යොමු කළ යුතුය.

6. එක් අයදුම් පත්‍රයක තනතුරු කිහිපයක් සහිත අයදුම්පත්, එක් සහතික පිටපත් මිටියකට අමුණා ඇති අයදුම්පත් කිහිපයක්, තනතුරු නිසි ලෙස සඳහන් නොකරන්න, සහතික පිටපත් නොමැති, අසම්පූර්ණ සහ අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

8. කරුණාකර ඉංග්‍රීසි භාෂාවෙන් අයදුම්පත පුරවන්න.

9. ඔබ බැංකුගත කළ ගිණුම් අංකය හා දිනය (අයදුම්පත් භාර ගැනීම අවසන් වන දිනයට පෙර) පිළිබඳ සැලකිලිමත් වන්න. අයදුම්පත් භාරගැනීමේ දිනට පසු බැංකුගත කරන අයදුම්පත් හා වැරදි ගිණුම් අංකයන්ට බැංකුගත කරන ලද අයදුම්පත් ප්‍රතික්ෂේප කරන බව කරුණාවෙන් සලකන්න.